# බුද්ධකාලීන ධර්මාර්ථ ව්‍යාඛ්‍යාන භාණක ශ්‍රාවක ශ්‍රාවිකාවෝ

ආචාර්ය ඩබ්.ඇම්. දේශප්‍රිය ගුණසේන

භාණක සම්ප්‍රදායයේ ප්‍රභවය, සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසකට පසු රජගහනුවර වේභාර පර්වතයේ සප්තපර්ණී ගුහාවෙහි තෙමසක් පුරා මහාකාශ්‍යප මහරහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ පළමු ධර්ම සංගීතියෙන් සිදු වූ බව, ආචාර්ය, ඊ.ඩබ්ලිව්. අදිකාරම්[1] පවසයි. මේ අදහස ම දරන ආචාර්ය, අබයරත්න අදිකාරී ද සංවෙසනිකා නම් මුල්ම ධර්ම සංගායනාවෙන් පසු පෙළ හා අටුවා පුරැකි ව පවත්වාගෙන ඒමේ භාරදූර කාර්යය මහතෙරවරුන්ට පැවරුණු බවත්, එතැන් සිට භාණක ක්‍රමය පවත්වාගෙන එන බවත් සඳහන් කරයි. එහෙත් මතවාදයක් ලෙස සැලකීමේ දී භාණක සම්ප්‍රදායයේ ප්‍රභවය බුදුන් වහන්සේ ජීවමාන ව වැඩ සිටි කාලයටත් වඩා පෙර අවධියක සිදු වූවක් ලෙස පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ දක්වති. ත්‍රිපිටකය පොත්වල ලියන ලද්දේ බුදුරදුන් පිරිනිවීමෙන්, අවුරුදු හාරසිය හතළිහක් (440) ගත වූ පසු ලක්දිව වළගම්බා (වට්ටගාමිනී අභය) රජතුමාගේ කාලයේ දී මාතලේ ආලෝක විහාරයේ දී ය. එතෙක් කල් එය කටපාඩමින් ගෙන ආයේය. මෙතරම් විශාල සාහිත්‍යයක් අවුරුදු සිය ගණනක් මුළුල්ලේ කටපාඩමෙන් පවත්වාගෙන ආ හැක්කේ කෙසේද යන්න මෙකල වසන්නන්ට ප්‍රහේලිකාවකි. නමුත් මෙය වේදය කටපාඩමෙන් ගෙනා අයුරු සහ දැනුදු වේදය කටපාඩමෙන් දරන බමුණන් සිටින බවත් සලකන විට මෙය විස්මයට කාරණයක් නොවේ. භාණක සම්ප්‍රදායයේ ඓතිහාසික සම්බන්ධය විමර්ශනය කළ ආචාර්ය, කේ. ආර්. නෝර්මන් ද, භාණකවරු පිළිබඳ ඉතිහාසය මුල් බුදුසමය දක්වා ඈතට දිවයන්නක් බව කියයි.[2]

---

1 පාලි සාහිත්‍යය, 19 පි.

2 A History of Indian Literature , p. 09

පෙරදිග අධ්‍යාපනයේ ඉගෙනුම් ක්‍රමය වූයේ වාචනා මාර්ගය යි. 'වාචනා' යනු කීම හෝ කියවීම යි. වාචනා මාර්ගය යනු කියවීමේ මාර්ගය යි. කියවාගෙන ආ පිළිවෙළ' නැතහොත් කට පාඩමෙන් පවත්වාගෙන ආ ක්‍රමයයි.[4] බුදුන් වහන්සේ ඉන්දියාවේ මධ්‍ය මණ්ඩලයේ පහළ වූයේ ක්‍රි.පූ. 06 වැනි සියවසේ දී වන අතර ඉන්දියානු අධ්‍යාපන ක්‍රමයට ඊටත් වඩා ඈත ඉතිහාසයක් ඇත. මෙම පෞරාණික බ්‍රාහ්මණ (අධ්‍යාපන) සම්ප්‍රදායයේ ප්‍රධාන ඉගෙනීමේ ක්‍රමය වූයේ ද ත්‍රිවේදය කටපාඩම් කිරීම යි. බ්‍රහ්මචාරී අවධිය තුළ ත්‍රිවේදය පාඩම් කළ යුතු විය. කටපාඩම් කිරීමේ හෙවත් වාචෝද්ගත කිරීමේ ක්‍රමය, බුදුන් වහන්සේගේ දේශනා ඉගෙනීමේ ක්‍රමයක්[5] ලෙස ද භාවිත කොට ඇත. බුදුරදුන් දවස කරුණු ඉදිරිපත් කිරීමේ ක්‍රම දෙකක් ක්‍රියාත්මක වූ බව මහාචාර්ය, මලිවර් අබේනායක[6] කියයි. එනම්,

i. කෙටියෙන් කරුණු කීම හා
ii. සවිස්තර ව කරුණු කීම යි. බුද්ධකාලයේ ධර්මධරයන් විසින් මේ ක්‍රම දෙකින් එකක් අවස්ථාවෝචිත ව භාවිත කළ බවත් පෙන්වා දෙයි.

බුදුරදුන් නොයෙක් පර්යායෙන් ශ්‍රාවකයාට ධර්මය දේශනා කළ අතර එය තහවුරු කිරීමේ පිළිවෙළ මෙසේ සඳහන් වේ.'චතුන්නං ආරියසච්චානං ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං.'[7] මෙහි

ආචික්ඛනා - ඉදිරිපත් කරන දහම පිළිබඳ කරුණු සංක්ෂිප්ත ව භාවිත ව හඳුන්වා දීම

දෙසනා - මුලින් හඳුන්වා දුන් කරුණු පිළිබඳව විස්තරාත්මක ව පැහැදිලි කිරීම

පඤ්ඤපනා - අපේක්ෂිත දහම් කරුණු හඳුනා ගැනීමට අවකාශ සැලසීම

3 යදිදං චතුන්නං ආරිය සච්චානං ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං. මනි. III. 512 පි.
4 බෞද්ධ සාහිත්‍ය 05 පි.
5 සමන්තපාසාදිකා. I. 09 පි.
6 පාලි අධ්‍යයන විමර්ශනය. 422 පි.
7 මජ්ඣිම නිකාය. III. 512 පි.

පට්ඨපනා - හඳුනා ගත් කරුණ තහවුරු කිරීම
විවරණා - තහවුරු වූ දහම් කරුණ විස්තරාර්ථ වශයෙන් විවෘත කර දැක්වීම
විභජනා - එසේ විවරණය කළ ධර්මයෙහි විවිධ ප්‍රභේදයන් දැක්වීම
උත්තානීකම්ම - ශ්‍රාවකයාට හැම අතින් ම අනාවරණය වූ උඩුකුරු වූ කරුණක් කොට දැක්වීම්[8] යනු යි.

බුදුරදුන් අවබෝධ කළ ධර්මය ගැඹුරු, නිපුණ, දුර්දශ හා සියුම් වූවත් බැවින් ශ්‍රාවකයා හට සූත්‍ර දේශනා සංග්‍රහ කිරීමේ දී පුනරුක්ත පාලි ප්‍රයෝග බහුලව යෙදීමත් තුළ බුද්ධ දේශනාව වාචනා මාර්ගයෙන් මුඛ පරම්පරාවෙන් ගෙන ඒමේ දී ඒ ඒ ජාතීන්ගේ උච්චාරණයට අනුව දේශනා පාලියේ එක් ධර්ම පාඨයකට රූප බාහුල්‍යය ඇතිවීමත් උදාහරණ ලෙස බද්දේගම විමලවංස හිමියෝ[9] දක්වති. දේශනා පාලියේ විද්‍යමාන උක්ත ස්වභාවයන් තුළින්, භාණක ක්‍රමයේ ආරම්භය වෛදික යුගය දක්වා ඈත අතීතයකට ගෙන යෑමේ සාධාරණ බවක් පෙනේ.

බෞද්ධ සම්ප්‍රදාය තුළ භාණක ක්‍රමයේ ප්‍රභවය පළමු ධර්ම සංගීතියට පෙර අවධිය දක්වා ගෙන යා හැකිය. බුදුන් වහන්සේගේ ශ්‍රාවකයන් අතර පටිසම්භිදාලාභී මහරහතන් වහන්සේලා සම්මුඛ භාණකයන් ලෙස සැලකිය හැකිය. බුදුන් වහන්සේ භික්ෂූන් වහන්සේ අතරෙහි අගතනතුරු ප්‍රදානය කිරීමේ දී ශ්‍රාවක ශ්‍රාවිකාවන් සතු විශේෂ කුසලතා සලකා ම ඒවා ප්‍රදානය කොට තිබේ. සද්ධර්ම දේශනයට අදාළ ධර්මාර්ථ විභාගය, විචිත්‍ර හා මිහිරි කථිකත්වය, භාණකත්වය යන කරුණු සලකා සාරිපුත්ත, මොග්ගල්ලාන, ආනන්ද, මහාකච්චාන, ලකුණ්ටකභද්දිය, පුණ්ණමන්තානිපුත්ත, සොණකුටිකණ්ණතිස්ස, කුමාරකස්සප, මහාකොට්ඨිත, රාධ, වංගීස, ඛේමා, ධම්මදින්නා, යන ශ්‍රාවක-ශ්‍රාවිකාවෝ[10] අග්‍රස්ථාන ලැබූහ. බුදුන් වහන්සේගේ සම්මුඛ ශ්‍රාවකයන් අතර මහාප්‍රාඥ (මහාපඤ්ඤා) නාමය ලැබූ ශ්‍රාවකයන් වහන්සේලා එක්දහස් තුන්සියයක් දෙනා වැඩ සිටි බවත්, ඒ සියල්ලෝ ම, 'එහි භික්ඛු' මගින් උපසම්පදාව ලැබූ බවත්, අටුවාචාරීන් වහන්සේ සඳහන්

8 මජ්ඣිම නිකාය, අට්ඨකථා, IV, 196 පි., බුද්ධධර්මය, 30-31 පිටු.
9 බෞද්ධ සාහිත්‍ය, 127 පි.
10 අංගුත්තර නිකාය, I, 46-50 පිටු.

කරති.[11] මහාප්‍රාඥ මහරහතන් වහන්සේලා අතර සාරිපුත්ත, මොග්ගල්ලාන, ආනන්ද, අනුරුද්ධ, වංගීස, මහාකස්සප ආදි තෙරුන් වහන්සේලා පටිසම්භිදා, තෙවිජ්ජා, ඡළභිඤ්ඤා ආදි ඥානප්‍රභේද[12] ලැබූහ.

බුද්ධ ශාසනයේ සබ්‍රහ්මචාරී භික්ෂූන් වහන්සේට සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ මවුපියන් හා සමාන යැයි ද පණ්ඩිත යැයි ද අනුග්‍රාහක යැයි ද එබැවින් සේවනය කරන ලෙස ද බුදුන් වහන්සේ [13] වදාළහ. අග්‍රශ්‍රාවක සැරියුත් තෙරුන් වහන්සේ හැඳින්වීම සඳහා මජ්ඣිමනිකායේ අනුපද සූත්‍රයේ[14] පණ්ඩිතො, මහාපඤ්ඤො, පුථුපඤ්ඤො, හාසුපඤ්ඤො, ජවනපඤ්ඤො, තික්ඛපඤ්ඤො, නිබ්බෙධිකපඤ්ඤො, අනුපදධම්මවිපස්සක යැයි වර්ණනාවක් ද, සාරිපුත්තථෙරගාථාවේ[15] මෙධාවී, මහාඤාණී, මහාබුද්ධි,

11 සහස්සඤ්ච - පඤ්ඤාසඤ්ච පුනාපරෙ
එතෙ ථෙරා මහාපඤ්ඤා - සබ්බෙව එහි භික්ඛුකාති.
ථෙරගාථා අට්ඨකථා, II, 215 පි.

12 පටිසම්භිදා චතස්සො ච - විමොක්ඛාපිච අට්ඨිමෙ
ඡළභිඤ්ඤා සච්ඡිකතා - කතං බුද්ධස්ස සාසනන්ති
ථෙරගාථා අට්ඨකථා, II, 220 පි.

13 සෙවෙථ භික්ඛවෙ, සාරිපුත්ත මොග්ගල්ලානෙ, භජථ භික්ඛවෙ සාරිපුත්ත මොග්ගල්ලානෙ, පණ්ඩිතා භික්ඛූ අනුග්ගාහකා සබ්‍රහ්මචාරීනං. සෙයථාපි භික්ඛවෙ ජනෙත්ති එවං සාරිපුත්තො. සෙයථාපි ජාතස්ස ආපාදෙතා එවං මො මොග්ගල්ලානො. සාරිපුත්තො භික්ඛවෙ සොතාපත්ති ඵලෙ විනෙති, මොග්ගල්ලානො උත්තමත්ථෙ.
මජ්ඣිම නිකාය, III, 512 පි.

14 පණ්ඩිතො භික්ඛවෙ සාරිපුත්තො, මහාපඤ්ඤො භික්ඛවෙ සාරිපුත්තො, පුථුපඤ්ඤො, භික්ඛවෙ සාරිපුත්තො, හාසුපඤ්ඤො භික්ඛවෙ සාරිපුත්තො, ජවන පඤ්ඤා භික්ඛවෙ සාරිපුත්තං, තික්ඛ පඤ්ඤො භික්ඛවෙ සාරිපුත්තො, නිබ්බෙධික පඤ්ඤො, භික්ඛවෙ සාරිපුත්තො, සාරිපුත්තො භික්ඛවෙ අද්ධමාසං අනුපදධම්ම විපස්සනං විපස්සති. තත්‍රිදං භික්ඛවෙ සාරිපුත්තස්ස අනුපදධම්මවිපස්සනාය හොති. මජ්ඣිම නිකාය, III, 134 පි.

15 බහුස්සුතො ච මෙධාවී - සීලෙසු සුසමාහිතො,
චෙතො සමථානුයුත්තො - අපි මුද්ධනි තිට්ඨතු (988 ගා.)
උපසන්තො උපරතො - මන්තභාණී අනුද්ධතො,
අප්පාසි පාපකෙ ධම්මෙ - දුමපත්තං ව මාලුතො (1006)
උපසන්තො අනායාසො - විප්පසන්නො අනාවිලො
කල්‍යාණසීලො මෙධාවී - දුක්ඛස්සන්තකරො සියා (1007)
වත්තානුවත්තකො ථෙරො - මහාඤාණී සමාහිතො,

මහාමති යැයි විශේෂණ පද රාශියක් ද විද්‍යමාන වේ.

මෙහි බහුස්සුත යනු බොහෝ ඇසූ පිරූ තැන් ඇති[16] යන්න යි. යම් පුද්ගලයෙක් ශීලාදී ප්‍රතිසංයුක්ත සූත්‍ර, ගෙයය ආදී භේදයන්ගේ බොහෝ කොට ඇසීමට ලක්වන්නේ බහුශ්‍රැත[17] නම් වේ. මෙධාවි යනු ප්‍රඥා ඇත්තා[18] යනු යි. ධර්මජ ප්‍රඥාවෙන් යුක්ත වූයේ මේධාවී[19] නම් වේ. මේධාවී නම් වූ ප්‍රඥාවෙහි අවස්ථා තුනක් අටුවාචාරීන් වහන්සේ දක්වති. එනම්, ධර්ම රසය වැටහෙන ප්‍රඥාව, පරිහරණය කළ යුතු ප්‍රඥාව, සත්‍ය අවබෝධ කළ ප්‍රඥාව[20] යනු යි. වත්තානුවත්තනෙතා යනු ශාස්තෲන් වහන්සේ විසින් පවත්වන ලද ධර්මචක්‍රයට අනුව කටයුතු කරන්නා[21] යි. මහාඥාණී යනු නුවණැත්තා[22] යි. මහාපඤ්ඤා හා මහාබුද්ධි යනු සමානාර්ථවත් විශේෂණ පද දෙකකි. මහාපඤ්ඤා යන්නෙහි ප්‍රභේද හයක් සැරියුත් තෙරුන් හැඳින්වීමට විශේෂණ පද ලෙස බුදුහිමියන් ම දේශිත බව පූර්වයෙහි දක්වන ලදි. උක්ත විශේෂණාර්ථ පද සියල්ල අටුවාචාරීන් වහන්සේ දීර්ඝ ලෙස විවරණය කරති.

1. මහාපඤ්ඤා - මහා ප්‍රඥාව යි.

එනම්, ධර්ම මහත්වය යි. නිරුක්තීන්හි මහත්වය යි. දේශනා කිරීමේ මහත්වය යි. ශීලයෙහි මහත්වය යි. සමාධියෙහි මහත්වය යි. ප්‍රඥාවෙහි මහත්වය යි. මහාවිහාර සමාපත්ති, ආර්යසත්‍යය, සතිපට්ඨාන, සම්මප්පධාන ඉද්ධිපාද, පඤ්චඉන්ද්‍රිය, පඤ්චබල, සප්තබොජ්ඣංග ආදියෙහි මහත්වය[23] යි.

---

පඨවාපග්ගිසමානො - න රජ්ජති න දුස්සති (1013)
පඤ්ඤාපාරමිතං පත්තො - මහාබුද්ධි මහාමති,
අජළො ජළසමානො - සදා චරති නිබ්බුතො (1014)
ථෙරගාථා, 228-234 පිටු.

16 බහුස්සුතොති පරියත්ති බාහුසච්චවසෙන බහුස්සුතො, සුත්තගෙයාදි බහුං සුතං එතස්සාති බහුස්සුතො. ථෙරගාථා අට්ඨකථා, පරමත්ථදීපනී I, 433 පි.

17 යො පුග්ගලො සීලාදී පටිසංයුත්තස්ස සුත්ත ගෙයාදි භෙදස්ස බහුනො සුතස්ස සම්භවෙන බහුස්සුතො. එම., II, 114 පි.

18 පාලි සිංහල ශබ්දකෝෂය, 413 පි.

19 ධම්මොජපඤ්ඤාය සමන්නාගතො මෙධාවී. ථෙරගාථා අට්ඨකථා, II, 115 පි.

20 ධම්මොජ පඤ්ඤාය පාරිහාරිය පඤ්ඤාය පටිවෙධ පඤ්ඤාය වසෙන මෙධාවී. එම., 114 පි.

21 වත්තානුවත්තනෙතාති සත්ථාරා වත්තිතස්ස ධම්මචක්කස්ස අනුවත්තනෙතා. එම., 117-118 පිටු.

22 මහාඤාණීති මහාපඤ්ඤො එම., 118 පි.

23 ථෙරගාථා අට්ඨකථා, පරමත්ථදීපනී II, 118-120 පිටු.

2. පුථු පඤ්ඤා - පළල් වූ විශාල වූ ප්‍රඥාව යි.
3. හාසු පඤ්ඤා - සිනා බහුල කොට ඇති ප්‍රඥා ඇත්තා යි.
4. ජවන පඤ්ඤා - දුවන ප්‍රඥාව යි. (වහා වැටහීම වෙත ගමන් කරන්නා)
5. නිබ්බේධික පඤ්ඤා - නිපුණු අවබෝධය, විනිවිද යන ප්‍රඥාව යි.

මහාමති යනු ධර්ම විනිශ්චයෙහි වෙළුම් සංඛ්‍යාත මහත් වූ න්‍යාය මාර්ග ගැනීමේ ප්‍රඥාව යි. සිවුවැදෑරුම්, සොළොස් වැදෑරුම්, සතළිස් සතර වැදෑරුම්, සැත්තෑතුන් වැදෑරුම් වශයෙන් වූ ප්‍රඥාවෙහි ප්‍රභේද ගැනීමේ නුවණ[24] යි.

සැරියුත් තෙරුන් වහන්සේ සඳහා භාවිත විශේෂණ පද විග්‍රහ කිරීමෙන් ම උන්වහන්සේගේ ප්‍රඥා ගම්භීරත්වය විනිශ්චය කළ හැකි ය. මහා ප්‍රාඥ වූ ශ්‍රාවකයන් අතරෙහි අග්‍රස්ථාන ලැබූ සැරියුත් තෙරුන් වහන්සේ, බුදුරදුන් විසින් පවත්වන ලද ධර්මචක්‍රය පැවැත්වීමෙහි ද සැරියුත් තෙරුන් හා සමාන අන් එකදු පුද්ගලයෙකු ද නැතැයි[25] බුදුමුවින් ම වර්ණිත වේ. සංයුත්තනිකායේ සුසීම සූත්‍රයෙහි[26] බුදුරදුන් හා ආනන්ද තෙරුන් අතර සැරියුත් තෙරුන් අරබයා පැනනැගී සාකච්ඡාවක් විද්‍යමාන වේ. එහි සැරියුත් තෙරුන් සඳහා භාවිත විශේෂණයන් රැසකි. පූර්වෝක්ත මහාප්‍රාඥ විශේෂණයට අතිරේක ව අල්පේච්ඡය (අප්පිච්ඡො), සන්තුෂ්ටකය (සන්තුට්ඨො), පවිවිත්තය (පවිවිත්තො), අසංසට්ඨය (අසංසට්ඨො), අරඹන ලද වීර්ය ඇත්තේය (ආරද්ධවිරියො), වක්තෘය (වත්තා), වචනක්ෂමයන (වචනක්ඛමො), චෝදකය (චොදකො), පාපගර්හිතය (පාපගරහී) යනු යි.

සංයුත්තනිකායේ සාරිපුත්ත සූත්‍රය[27] තුළ විවරණය වන්නේ සැරියුත් තෙරුන් ගැන වංගීස තෙරුන්ගේ ප්‍රශංසාවකි. සැරියුත් තෙරුන්ගේ

---

24 එම II, 118 පි.

25 නාහං භික්ඛවෙ අඤ්ඤං එකපුග්ගලම්පි සමනුපස්සාමි, යො එවං තථාගතෙන අනුත්තරං ධම්මචක්කං පවත්තිතං සම්මදෙව අනුප්පවත්තෙති, යථයිදං භික්ඛවෙ සාරිපුත්තො භික්ඛවෙ තථාගතෙන අනුත්තරං ධම්මචක්කං පවත්තිතං සම්මදෙව අනුප්පවත්තෙතීති.
එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං මහා පඤ්ඤානං යදිදං සාරිපුත්තො. අංගුත්තර නිකාය, I, 46 පි.

26 සංයුත්ත නිකාය, I, 122 පි.

27 එම, I, 338 පි.

ධර්ම දේශනයේ දී සුවිශේෂතා රැසක් ඉදිරිපත් වේ. සැරියුත් තෙරුන්ගේ දහම් දෙසීම තුළ පරිපූර්ණ වූ පළිබෝධ රහිත වූ නිදොස් නො ගිලිහුණු පදව්‍යඤ්ජන ඇති, අර්ථය හැඟවීමට සමත්, දහැමි කථාවෙන් කරුණු දක්වන්, සමාදන් කරවන්, තෙද ගන්වන් සතුටු කෙරෙන්, එබැවින් අර්ථය අවබෝධ කිරීමට කැමති භික්ෂූහු යොමු කළ කන් ඇති ව දහම් අසත් යැයි දක්වේ. අනතුරු ව ගම්භීර පඤ්ඤා මේධාවී, මග්ගාමග්ගස්ස කොවිද, මහාපඤ්ඤ යන විශේෂණයන්ගෙන් හැඳින්වෙන සැරියුත් තෙරුන්ගේ දේශනයෙහි ස්වභාවයන් රැසක් විවරණය කෙරේ. එනම්,

i. සංක්ෂිප්ත ව දේශනා කිරීම (සංඛිත්තෙනපි)
ii. විස්තරාත්මක ව දේශනා කිරීම (විත්ථාරෙනපි)
iii. මධුර ස්වරයෙන් දේශනා කිරීම (සාලිකායිව නිග්ඝොසො)
iv. වහා වැටහීම පැන නගින සේ දේශනා කිරීම (පටිභානං උදීරයි)
v. ඇහුම් කටයුතු වූ ස්වරයෙන් දේශනා කිරීම (සරෙන රජනීයෙන)
vi. සිත්කලු ස්වරයෙන් දහම් දේශනා කිරීම (සවණීයෙන වග්ගුනා)[28]

උක්ත ස්වභාවයන්ගෙන් උපලක්ෂිත මධුරභාණී ස්වරය ජීව විද්‍යාත්මක උරුමයක් ලෙසත් දේශනා කුසලතාව හා විලාසයත්, ප්‍රඥා මහිමයත් දායාද වූ සැරියුත් තෙරුන් වහන්සේ ධර්ම සේනාපති[29] ලෙස ම ක්‍රියා කළහ. එබැවින් උන්වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර[30] නිබඳ ව අභිධම්ම ගුරුකුලය දඹදිවින් ලක්දිවට පවත්වා ගෙන පැමිණි බව ; අට්ඨකථාචාරීන් වහන්සේ දක්වති. සද්ධර්මාරක්ෂක ගුරුකුලයේ ආදි කර්තෘත්වය දරන සැරියුත් තෙරුන් වහන්සේ ම මහා පඤ්ඤා, ධම්මසේනාපති, ධම්මචක්කානුවත්තක ආදි විශේෂණයන්ගෙන් සුපෝෂිත ව සම්මුඛ ශ්‍රාවක භාණක ගුරුකුලය ඇරඹූහ.

---

28 එම., 324 පි

29 ධම්මසංගණීප්පකරණ අට්ඨකථා, අත්ථසාලිනී, 14 පි.

30 ආචරියපරම්පරාය, අයංහි සාරිපුත්තත්ථෙරො භද්දජි සොභිතො පියජාලි පියපාලො පියදස්සී කොසියපුත්තො සිග්ගවො සන්දෙහො මොග්ගලිපුත්තො සුදත්තො ධම්මියො දාසකො සොනකො රෙවතොති එවමාදිහි යාව තතිය සංගීතිකාලා ආභතො, තතො උද්ධං තෙසං යෙව සිස්සානුසිස්සෙහිති එවං තාව ජම්බුදීපතලෙ ආචරිය පරම්පරාය ආභතො. එම, 26 පි.

සද්ධර්මාරක්ෂක සම්බුද්ධ ශ්‍රාවක ගුරුකුලයේ ධර්මභාණ්ඩාගාරික ලෙස අගතනතුරු ලැබූයේ ආනන්ද තෙරුන් වහන්සේ ය. උන්වහන්සේ කරුණු පහකින් (05) අග්‍රස්ථාන[31] ලැබූහ. උන්වහන්සේ හැඳින්වීම සඳහා ථෙරගාථා පාළියේ[32] බහුස්සුතො, චිත්තකථී, ජාතිමරණ පාරගූ, පුබ්බාපරඤ්ඤූ, අත්ථඤ්ඤූ, නිරුත්ති පද කොවිද, ධම්මධරො, කොසාරක්ඛො, ධම්මාරාමො, ධම්මරතො, ධම්මං අනුවිචින්තිය, ධම්මං අනුස්සර, සද්ධම්ම ධාරකො, ගතිමන්තො, සතිමන්තො, ධිතිමන්තො, රතනාකාරො, ආදී බුද්ධිමහිමය ප්‍රකාශිත විශේෂණ පද රාශියක් යෙදී තිබේ.

මෙම විශේෂණ පද අතරින් 'බහුස්සුතො' යන්න පමණක් සැරියුත් තෙරුන් වහන්සේට ද යෙදී තිබේ. සෙසු සියල්ල ආනන්ද තෙරුන් වහන්සේට ම විශේෂණ වශයෙන් භාවිත කොට ඇත. ආනන්ද තෙරුන් වහන්සේ ධර්ම භාණ්ඩාගාරික ව පර්යාප්තතියෙහි සිට ධර්මය උද්ග්‍රහණය, ධාරණය කළ හෙයින් ද දේශනා කළ හෙයින් ද බහුශ්‍රැතයන් අතර අග්‍ර වූහ.[33] සතිමන්ත, ගතිමන්ත, ධිතිමන්ත යන පද විග්‍රහ කළ අටුවාචාරීන් වහන්සේ, ආනන්ද තෙරුන් වහන්සේ එක් පදයේ සිට පද හැට දහසක්, බුදුරදුන් විසින් දේශිත සද්ධර්මය දේශනා කළ පරිද්දෙන් ම ධාරණය කිරීමට සමත් වෙති. රන් බඳුනක දමූ සිංහ තෙල් නො නැසී ආරක්ෂා වන්නා සේ, එක්

---

31 එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං බහුස්සුතානං යදිදං ආනන්දො - පෙ - සතිමන්තානං යදිදං ආනන්දො, පෙ-ගතිමන්තානං යදිදං ආනන්දො, - පෙ ධිතිමන්තානං යදිදං ආනන්දො - පෙ - උපට්ඨාකානං යදිදං ආනන්දො, අංගුත්තරනිකාය, I. 48 පි.

32 බහුස්සුතො චිත්තකථී - බුද්ධස්ස පරිචාරකො
පන්නභාරො විසඤ්ඤුත්තො - සෙය්‍යං කප්පෙති ගොතමො (1026)
ඛීණාසවො විසඤ්ඤුත්තො - සංගාතීතො සුනිබ්බුතො
ධාරෙති අන්තිමං දෙහං - ජාතිමරණ පාරගූ (1027)
පුබ්බාපරඤ්ඤූ අත්ථඤ්ඤූ - නිරුත්තිපද කොවිදො
සුග්ගහීතං ච ගණ්හාති - අත්ථං වොපපරික්ඛති (1033)
බහුස්සුතො ධම්මධරො - කොසාරක්ඛො මහෙසිනො
චක්ඛු සබ්බස්ස ලොකස්ස - පූජනීයො බහුස්සුතො (1036)
ධම්මාරාමො ධම්මරතො - ධම්මං අනුවිචින්තයං
ධම්මං අනුස්සරං භික්ඛු - සද්ධම්මා න පරිහායති (1038)
ගතිමන්තො සතිමන්තො - ධිතිමන්තො ච යො ඉසි
සද්ධම්මධාරකො ථෙරො - ආනන්දො රතනාකරො (1054)
ථෙරගාථා පාළි, 234-240 පිටු.

33 අංගුත්තර නිකායඅට්ඨකථා, මනොරථපූරණී I, 159-160 පිටු.

ව්‍යඤ්ජනයකුදු නො වෙනස් ව ධාරණය කිරීමේ සාමර්ථ්‍යයත්, අර්ථ දැරීමේ සාමර්ථ්‍යයත්, ඇතැයි දක්වති.[34] ආනන්ද තෙරුන් වහන්සේට 'ධිතිමන්ත' යැයි පැවසුවේ සිවු වැදෑරුම් වූ වීර්යයක් පැවති හෙයිනි. එනම්,

i. බුද්ධවචන උද්ග්‍රහණ වීර්යය - උග්ගහණ විරියං
ii. සජ්ඣායනා වීර්යය - සජ්ඣායන විරියං
iii. දැරීමේ වීර්යය - ධාරණ විරියං
iv. උපස්ථාන වීර්යය - සත්ථු උපට්ඨාන විරියං[35] යනු යි.

කෝසාරක්ඛ යන විශේෂණයෙන් අන්වර්ථ වූයේ බුදුන්වහන්සේගේ ධර්ම කෝෂය, ධර්ම රත්නය, ආරක්ෂා කරන්නා,[36] යන්නයි. 'සද්ධම්මධාරකො' යන්න 'සද්ධර්මය දරන්නා' [37] යැයි අටුවාචාරීන් වහන්සේ විවරණය කරති.

ආනන්ද තෙරුන් වහන්සේගේ ධර්මාර්ථ විවරණයන් පිළිබඳ බුදුරදුන් හා සම්බුද්ධ ශ්‍රාවකවරුන් ද ප්‍රසාදාත්මක ව වර්ණනා කොට තිබේ. ආනන්ද තෙරුන්ගේ ධර්මාර්ථ විවරණයක් වනමජ්ඣිමනිකායේ [38] සේඛ සූත්‍ර දේශනාව ඇසූ බුදුහු, "ආනන්දය, මැනවි. මැනවි. ආනන්දය, තෙපි කපිලවස්තු පුර ශාක්‍යකුලපුත්‍රයන්ට සේඛ ප්‍රතිපදාව කීවාහු" යැයි ප්‍රශංසා කළහ.

සැරියුත් තෙරුන් වහන්සේ ආනන්ද තෙරුන්ට ම වැටහුණු ධර්මාර්ථයක් අසා, ආනන්ද තෙරුන්ගේ ධර්මාර්ථ විභාගය ප්‍රශංසාවට ලක් කළහ. ආනන්ද තෙරුන් තුළ පැවති කුසලතා කිහිපයක් වේ. එනම්,

---

34 අයං හි ථෙරො එකපදෙයෙව ඨත්වා සට්ඨිපද සහස්සානි සත්ථාරො කථිතනියාමෙනෙව ගණ්හාති ගහිතඤ්ච සුවණ්ණභාජනෙ පක්ඛිත්තසීහවසා විය සබ්බකාලං න විනස්සති. අවිපරීත බ්‍යඤ්ජනාව ධාරණ සමත්ථාය සතිපුබ්බංගමාය පඤ්ඤාය අත්ථාවධාරණ සමත්ථාය සතිපුබ්බංගමාය පඤ්ඤාය අත්ථාවධාරණ සමත්ථාය පඤ්ඤා පුබ්බංගමාය සතියාච සමන්නාගතො. ථෙරගාථා අට්ඨකථා, පරමත්ථදීපනී II, 134 පි.

35 අංගුත්තර නිකාය අට්ඨකථා, මනෝරථපූරණී I, 160 පි.

36 භගවතො ධම්මකොසං ධම්මරතනං ආරක්ඛතීති කොසාරක්ඛො, ථෙරගාථා අට්ඨකථා,, පරමත්ථදීපනී II, 132 පි.

37 එම,

38 අථඛො භගවා උට්ඨහිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: සාධු සාධු ආනන්ද, සාධු ඛො ත්වං ආනන්ද කාපිලවත්ථවානං සක්‍යානං සෙඛං පාටිපදං අභාසීති. මජ්ඣිම නිකාය, II, 36 පි.

1. අර්ථ කුශලතාව - **අත්ථකුසලො**
2. ධර්ම කුශලතාව - **ධම්මකුසලො**
3. නිරුක්ති කුශලතාව - **නිරුත්තිකුසලො**
4. ව්‍යඤ්ජන කුශලතාව - **ව්‍යඤ්ජන කුසලො**
5. පූර්වාපර සන්ධි ගැලපීමේ කුශලතාව - **පුබ්බාපර සන්ධි කුසලො**[39] යනු යි.

ආනන්ද තෙරුන් උක්ත ධර්ම පසෙහෙන් යුක්ත යැයි පැවසීමට හේතු වන්නේ, උන්වහන්සේගේ **පටිභාන** - වහා වැටහීමේ ශක්තිය යි.[40] කුශල ධර්මයන් ඇසීමත් සමඟ ම දරන්නේ ද මැනවින් උගන්නේ ද බොහෝ කොට ගන්නේ ද ගන්නා ලද දෙය නො නැසී ආරක්ෂා කරන්නේ ද[41] ස්වභාවයන් තුළ පටිභානත්වය තහවුරු වේ.

බුදුරජුන් විසින් ද නුවණැති සබ්‍රහ්මචාරීන් විසින් ද වර්ණනා කරනු ලැබූ ආනන්ද තෙරුන්ගේ සංක්ෂිප්ත ධර්මයෙහි, ධර්මාර්ථ විභාග කිරීමේ ශක්‍යතාව ප්‍රකට වූ කීර්ති ශබ්දයකි. එබැවින් බුදුරජුන් විසින් වදාළ සංක්ෂිප්ත ධර්මයෙහි විස්තරාර්ථ විභාග දැන ගැනීමට ආනන්ද තෙරුන් සුදුස්සෙකු ලෙස හඳුනා ගත් බවට සාධක සංයුත්තනිකායේ ලෝකාන්තගමන සූත්‍රය.[42]

---

39 අච්ඡරියං ආවුසො, අබ්භුතං ආවුසො, යාව සුභාසිතං චිදං ආයස්මතා ආනන්දෙන - ඉමෙහි ච මයං පඤ්චහි ධම්මෙහි සමන්නාගතං ආයස්මන්තං ආනන්දං ධාරෙම. ආයස්මා ආනන්දො අත්ථකුසලො ධම්මකුසලො නිරුත්තිකුසලො ව්‍යඤ්ජනකුසලො පුබ්බාපරකුසලොති. අංගුත්තර නිකාය ණි III. 326 පි.

40 ආයස්මා ඛො ආනන්දො බහුස්සුතො, පටිභාතු ආයස්මන්තඤ්ඤෙව ආනන්දන්ති. එම.,

41 එත්තාවතා ඛො ආවුසො සාරිපුත්ත, භික්ඛු ඛිප්පනිසන්තිච හොති කුසලෙසු ධම්මෙසු, සුග්ගහිතගාහී ච, බහුංච ගණ්හාති ගහිතං චස්ස නප්පමුස්සති. එම.,

42 අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි. අයං ඛො ආයස්මා ආනන්දො සත්ථු චෙව සංවණ්ණිතො, සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං. පහොති චායස්මා ආනන්දො ඉමස්ස භගවතා සංඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. යන්නූන මයං යෙනායස්මා ආනන්දො තෙනුපසංකමෙය්‍යාම. සනි. IV. 198 පි.

සාමඤ්ඤඵල සූත්‍රය,[43] ඡන්න සූත්‍රය,[44] තතිය අධම්ම සූත්‍රය,[45] ආදියෙන් තහවුරු වේ. ආනන්ද තෙරුන් විසින් දේශනා කළ ධර්මාර්ථ විභාගය, එය ඇසූ භික්ෂූන් වහන්සේගේ ද බුදුරදුන්ගේ ද ප්‍රශංසාවට ද ලක්වී තිබේ. එසේ ම පද විභාගාත්මක[46] ධර්මාර්ථ විභාගය බුදුරදුන් විසින් සිදු කළේ නම්, මේ පද ව්‍යඤ්ජනයන්ගෙන් ම සිදු කරන බවත්, මෙය ම අර්ථය බවත් [47] පවසා පිළිගෙන තිබේ.

ආනන්ද තෙරුන් වහන්සේ තථාගතයන් වහන්සේගේ අග්‍ර උපස්ථායක තනතුර භාර ගැනීමේ දී ඉල්ලීම් හතරක් හා ප්‍රතික්ෂේප කිරීම් හතරක් ඉදිරිපත් කළහ. ඒ අතර තමන් වහන්සේ නැති තැන දේශනා කරන ලද සියලු ධර්මය, ඒ ලෙසින් ම නැවත තමන් වහන්සේට දේශනා කරන මෙන් කරනු ලැබූ ඉල්ලීම එක් කරුණකි. මේ තුළින් අර්ථවත් වන්නේ ද බුදුරදුන් දේශනා කළ සියලු ධර්මය අසා දැන ගත් තෙරුන් වහන්සේ නම් ආනන්ද තෙරණුවෝ ම බව යි. බුද්ධ පරිනිර්වාණයෙන් පසු ගෝපක මොග්ගල්ලාන බ්‍රාහ්මණයා ආනන්ද තෙරුන් වෙත පැමිණ, නුඹ වහන්සේ මේ ගෞතම බුද්ධ ශාසනයෙහි බහුශ්‍රැතයෙකු යි ප්‍රකට ය. එසේ වීමට බුදුරදුන් කෙතෙක් ධර්මයන් නුඹවහන්සේට වදාළාහු ඔබ විසින් කෙතෙක් ධර්මය වදාරන ලද්දාහු දැයි ඇසීය. ඊට පිළිතුරු වන්නේ, 'බුදුරදුන් වෙතින් ධර්මස්කන්ධ දෙ අසූදහසක් හා සැරියුත් තෙරුන් ආදී ශ්‍රාවකවරුන්ගෙන්

---

43 එම., 206 පි.

44 එවමෙතං ආවුසො ආනන්දහොති, යෙසං ආයස්මන්තානං තාදිසා සබ්‍රහ්මචාරයො අනුකම්පකා අත්ථකාමා ඔවාදකා අනුසාසකා. ඉදඤ්ච පන මේ ආයස්මතො ආනන්දස්ස ධම්මදෙසනං සුත්වා ධම්මො අභිසමෙතොති.
එම., III, 232 පි.

45 සාධු සාධු භික්ඛවෙ පණ්ඩිතො ආනන්දො, මහාපඤ්ඤො භික්ඛවෙ ආනන්දො. මමඤ්චෙපි තුම්හෙ භික්ඛවෙ උපසංකමිත්වා එතමත්ථං පුච්ඡෙය්‍යාථ, අහම්පි චෙතං අත්ථං එවමෙව ව්‍යාකරෙය්‍යං, යථාතං ආනන්දෙන ව්‍යාකතං. එසො චෙතස්ස අත්ථො, එවඤ්ච නං ධාරෙය්‍යාථාති. අංගුත්තර නිකාය, VI, 414 පි.

46 තෙසං නො ගතං භන්තෙ, ආයස්මතා ආනන්දෙන ඉමෙහි ආකාරෙහි ඉමෙහි පදෙහි ඉමෙහි ව්‍යඤ්ජනෙහි අත්ථො විභත්තොති. සංයුත්ත නිකාය, IV, 204 පි., 212 පි.

47 පණ්ඩිතො භික්ඛවෙ ආනන්දො, මහාපඤ්ඤො, භික්ඛවෙ ආනන්දො, මඤ්චෙපි තුම්හෙ භික්ඛවෙ එතමත්ථං පටිපුච්ඡෙය්‍යාථ, අහම්පි'ච නං එවමෙව ව්‍යාකරෙය්‍යං, යථා තං ආනන්දෙන ව්‍යාකතං, එසො චෙව චෙතස්ස අත්ථො, එවඤ්ච නං ධාරෙය්‍යාථාති. එම.,

ධර්මස්කන්ධ දෙ දහසක් උගත්තෙමි සුවාසූ දහසක් ධර්මස්කන්ධයෝ මට පුගුණයහ[48] යනු යි.

ආනන්ද තෙරුන් වහන්සේ ඒක ශ්‍රැතිමාත්‍ර වශයෙන් එක් පදයේ සිට සද සැටදහසක් " ස්මරණ, ධාරණ වශයෙන් පවත්වා ගැනීමේ කුශලතාවෙන් යුක්ත වූ බැවින්, බහුශ්‍රැතභාවයත්, ස්මෘතිමත්භාවයත් නිසා ම සද්ධර්මාරක්‍ෂක සම්මුඛ ශ්‍රාවකයන් වහන්සේලා අතර ප්‍රධාන ධර්ම භාණකයන් වහන්සේ වූහ. ධර්ම භාණ්ඩාගාරික තනතුර දැරූ ආනන්ද තෙරුන් වහන්සේ, පළමු ධර්ම සංගීතියේ දී ධර්මය පිළිබඳ ප්‍රශ්න නිරාකරණය කළ බවත්, උන්වහන්සේ ඇතුළු ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර දීඝනිකාය ආරක්ෂා කිරීමේ[50] ගුරුකුලය ඇරඹ වූ බවත් සඳහන් වේ. එබැවින් ආනන්ද තෙරුන් වහන්සේ ද සම්මුඛ ශ්‍රාවක ධර්මභාණක ගුරුකුලයේ ආදිකර්තෘවරයෙකු සේ සැලකීම යුක්ති යුක්ත වේ.

සද්ධර්මාරක්‍ෂක සම්මුඛ ශ්‍රාවක ගුරුකුලයේ දෙවැනි ස්ථානය ලැබූයේ සෘද්ධිමත් භික්ෂූන් වහන්සේලා අතර අගතැන් ලැබූ මහාමොග්ගල්ලාන තෙරණුවෝ ය.[51] උන්වහන්සේ ද බුදුරදුන්ගේ සංක්ෂිප්ත ධර්මෝද්දේශයන්ට ධර්මාර්ථ විභාග දක්වූහ. සංයුත්තනිකායේ ඛන්ධ සූත්‍රය[52] මෙහි ලා කදිම සාධකයකි. වච්ඡගොත්ත පරිබ්‍රාජක තෙමේ බුදුරදුන් වෙත ගොස්, "භවත් ගෞතමයෙනි, කිම ලෝකය ශාස්වතදැයි" ප්‍රශ්න කළේය. උක්ත ප්‍රශ්නයට ලබාදුන් පිළිතුර ඇසූ පරිබ්‍රාජක තෙමේ, පසුව මහමුගලන් තෙරුන් වෙත ගොස් උක්ත ප්‍රශ්නය ම විචාළේය. මුගලන් තෙරුන් වහන්සේ එහි ලා ප්‍රකාශ කළ ධර්මාර්ථ විභාගය ඇසූ පරිබ්‍රාජක තෙමේ බුදුරදුන්ගේ විවරණයෙත්, මුගලන් තෙරුන්ගේ විවරණයත් සසඳා බැලුයි. ශාස්තෘන් වහන්සේගේ ද මුගලන්

48 ථේරගාථා අට්ඨකථා, පරමත්ථදීපනී II, 130 පි.
ද්වාසීතිං බුද්ධතො ගණ්හිං - ද්වෙ සහස්සානි භික්ඛුතො
චතුරාසීතිසහස්සානි - යෙ මෙ ධම්මා පවත්තිනො
විනය අට්ඨකථා, සමන්තපාසාදිකා I, 16 පි.

49 ථේරගාථා අට්ඨකථා, පරමත්ථදීපනී II, 134 පි.

50 එවං තිවග්ග සංගහං චතුත්තිංසසුත්තන්ත පටිමණ්ඩිතං චතුසට්ඨි භාණවාර පරිමාණං තන්තිං සංගායිත්වා අයං දීඝනිකායො නාමාති වත්වා ආයස්මන්තං ආනන්දං පටිච්ඡාපෙසුං. ආවුසො ඉමං තුය්හං නිස්සිතකෙ වාචෙහීති.
දීඝනිකාය අට්ඨකථා, සුමංගලවිලාසිනී I, 11 පි.

51 එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං ඉද්ධිමන්තානං යදිදං මහාමොග්ගල්ලානො. අංගුත්තර නිකාය, I, 46 පි.

52 සංයුත්ත නිකාය, IV, 696 පි.

තෙරුන්ගේ ද අර්ථයෙන් අර්ථය, ව්‍යඤ්ජනයෙන් ව්‍යඤ්ජනය ගැළපෙන බවත්, සමවන බවත් විරුද්ධ නො වන බවත් [53] ප්‍රකාශ කළේය. මහමුගලන් තෙරුන් වහන්සේ ද නිබඳ ව බුදුරදුන්ගේ වර්ණනාවට ලක් වූ බවත්, ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ ද ප්‍රසාදය ලැබූ බවත්, සංක්ෂිප්ත ධර්මෝද්දේශයන්ට විස්තර විභාග කළ අවස්ථා රැසක් විද්‍යමාන බව ද පැවසිය හැකිය.

බුද්ධශ්‍රාවකයන් අතර දශමස්ථානයෙහි ලා සංක්ෂිප්ත භාෂිතයාගේ විස්තර විභාග කථනයේ අග්‍රස්ථානය ලැබුවෝ මහාකච්චාන තෙරණුවෝ [54] ය. මුන්වහන්සේ ද සම්මුඛ ශ්‍රාවකවරුන් අතරින් සද්ධර්මාරක්ෂක ගුරුකුලයේ ප්‍රමුඛ ශ්‍රාවකයෙකි. උන්වහන්සේ හැඳින්වීම සඳහා සූත්‍ර සාහිත්‍යයේ විවිධ තැන්හි හමු වන විශේෂණ පදයන්ගෙන් ඒ බව තහවුරු වේ. මහාකච්චාන තෙරුන් වහන්සේ බුද්ධභාෂිත ධර්මෝද්දේශයන්ට, ධර්මාර්ථ විභාග දක්වූහ. උන්වහන්සේ බුදුරදුන්ගේ වර්ණනාවටත්, සබ්‍රහ්මචාරී ශ්‍රාවකවරුන්ගේ ප්‍රසාදයත් දිනා ගත් තෙරනමකි. මජ්ඣිමනිකායේ මහාකච්චාන භද්දෙකරත්ත සූත්‍රය,[55] උද්දේස විභංග සූත්‍රය,[56] මධුපිණ්ඩික සූත්‍රය ආදියෙහි බුදුරදුන්ගේ සංක්ෂිප්ත ධර්මෝද්දේශයට ධර්මාර්ථ විභාග දක්වීම සඳහා ආරාධනා කරනු ලබන්නේ මහාකච්චාන තෙරුන්ට ය. මහාකච්චාන තෙරුන්ගේ ධර්මාර්ථ විභාගය අවසන් වීමෙන් පසු බුදුරදුන් විසින් ප්‍රශංසා කොට,[57] එම ධර්මාර්ථ විභාගය තමන් වහන්සේගේ ධර්මාර්ථ දක්වීමට සමාන කිරීමක් සිදු වීම සුවිශේෂ වූවකි.

---

53 අච්ඡරියං හො මොග්ගල්ලාන අබ්භුතං හො මොග්ගල්ලාන, යත්‍රහි නාම සත්ථු ච සාවකස්සච අත්ථෙනත්ථො ව්‍යඤ්ජනෙන ව්‍යඤ්ජනං සංසන්දිස්සති සමෙස්සති න විහායිස්සති, යදිදං අග්ගපදස්මිං. එම., 700 පි.

54 එතදග්ගං භික්ඛවේ මම සාවකානං භික්ඛූනං සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං විභජන්තානං යදිදං මහාකච්චානොති. අංගුත්තර නිකාය, I. 46 පි.

55 අයං ඛො ආයස්මා මහාකච්චානො සත්ථුචෙව සංවණ්ණිතො, සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං, පහොති චායස්මා මහාකච්චානො ඉමස්ස භගවතා සංඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. මජ්ඣිම නිකාය, III, 414 පි.

56 එම., 480 පි., එම. I, 286 පි.

57 පණ්ඩිතො භික්ඛවෙ මහාකච්චානො, මහාපඤ්ඤො, භික්ඛවෙ මහා කච්චානො, මං චෙපි තුම්හෙ භික්ඛවෙ, එතමත්ථං පටිපුච්ඡෙය්‍යාථ, අහම්පිතං එවමෙතං ව්‍යාකරෙය්‍යං, යථා තං මහාකච්චානෙන ව්‍යාකතං - එසො චෙව තස්ස අත්ථො එවඤ්ච නං ධාරෙථාති. එම., 422 පි., 482 පි.

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ද ධර්මාර්ථ විභාගයෙහි කීර්ති ශබ්දය ප්‍රකට වූ අවස්ථාවක් ද විද්‍යමාන වේ. මජ්ඣිමනිකායේ මධුර සූත්‍රය තුළ මහාකච්චාන තෙරුන්ගේ කීර්ති ශබ්දය අර්ථවත් කෙරෙන විශේෂණ නාම කිහිපයක් යෙදෙයි. පණ්ඩිතො, ව්‍යත්තො, මෙධාවී, බහුස්සුතො, චිත්තකථී, කල්‍යාණපටිභානො යනුවෙන් විශේෂණ නාම හයකි. සැරියුත් තෙරුන්ට හා ආනන්ද තෙරුන්ට ද භාවිත නො වූ 'ව්‍යක්ත - බ්‍යත්ත, විසිතුරු ධර්ම කථා ඇති - චිත්තකථී' යහපත් වචන වැටහෙන - කල්‍යාණපටිභානො' යන විශේෂණයන්ගෙන් මහා කච්චාන තෙරුන් අන්වර්ථ විය.

සංක්ෂිප්ත ධර්මෝද්දේසයන්ට ධර්මාර්ථ විභාග දක්වීමේ ව්‍යක්ත බව හා විසිතුරු ධර්ම කථා ඇති බවට මධුපිණ්ඩික සූත්‍රය,[58] මහාකච්චාන භද්දෙකරත්ත සූත්‍රය,[59] උද්දෙසවිභංග සූත්‍රය[60] ආදිය කදිම සාධක වන්නේය.

සම්බුදු ශ්‍රාවකවරුන් අතරින් සැරියුත් තෙරුන්ට[61] නො දෙවැනි මූලාග්‍රය දක්වීමේ කුසලතාවක් මහාකච්චාන තෙරුන් සතු විය. ත්‍රිපිටක පාලිය තුළ මූලාග්‍රය දක්වමින්, ධර්මෝද්දේසයන්ට ධර්මාර්ථ විභාග කිරීමේ සුවිශේෂී ලක්ෂණය මහාකච්චාන තෙරුන් වෙතින් බෙහෙවින් විද්‍යමාන වේ. සංයුක්තනිකායේ හාලිද්දිකානි සූත්‍රයට[62] අට්ඨක වර්ගීය මාගන්දිය ප්‍රශ්නයත්, දුතිය හාලිද්දිකානි සූත්‍රයට[63] සක්කපඤ්හ සූත්‍රයත්, අංගුත්තර

---

58 මජ්ඣිම නිකාය, I, 272-286 පිටු.

59 එම., III, 410 - 422 පිටු.

60 එම.,470-482 පිටු.

61 ඉති බො භන්තෙ යං තං වුත්තං පාරායණෙ අජිතපඤ්හෙ,
යෙච සංඛාතධම්මාසෙ - යෙච සෙක්ඛා පුථූ ඉධ
තෙසං මෙ නිපකො ඉරියං - පුට්ඨො පබ්‍රූහි මාරිස, සංයුක්ත නිකාය, II, භූත සුත්ත, 74-78 පිටු.

62 වුත්තමිදං භන්තෙ, භගවතා අට්ඨකවග්ගියෙ මාගන්දිය පඤ්හෙ ඔකං පහාය අනිකෙතසාරී - ගාමෙ අකුබ්බං මුනි සන්ථවානි, කාමෙහි රිත්තො අපුරෙක්ඛරානො - කථං න විග්ගය්හ ජනෙන කයිරා.
සංයුක්ත නිකාය, III, 14-20 පිටු.

63 වුත්තමිදං භන්තෙ, භගවතා සක්ක පඤ්හෙ, යෙ තෙ සමණ බ්‍රාහ්මණා තණ්හාසංඛය විමුත්තා, තෙ අච්චන්ත නිට්ඨා අච්චන්ත යොගක්ඛෙමිනො අච්චන්ත බ්‍රහ්මචාරිනො අච්චන්ත පරියොසානා සෙට්ඨා දෙවමනුස්සානං ති.
එම., 20-22 පිටු.

නිකායේ කාලි සූත්‍රයට[64] කුමාරි ප්‍රශ්නයක්, මූලාශ්‍රය කොට බුදුරදුන්ගේ ධර්මාර්ථ විවරණ උද්ධෘත කොට තිබේ. මහාකච්චාන තෙරුන්ගේ මූලාශ්‍රය දක්වමින් ධර්මාර්ථ විභාග කිරීමේ කුසලතාව සැරියුත් තෙරුන්ට ද විෂය වූවත්, සමකාලීන වෙනත් ශ්‍රාවකවරුන් ද එහි ලා උත්සුක වූ බවට සාධක තිබේ. නමක් සඳහන් නො වන 'එක්තරා මහණෙක් - අඤ්ඤතරො භික්ඛු' යන සංඥාවෙන්, අංගුත්තරනිකායේ[65] මජ්ඣෙ සූත්‍රයට පාරායන වග්ගයේ මෙත්තෙය්‍ය ප්‍රශ්නයෙන් උද්ධෘත කොට තිබීම කදිම සාධකයකි. මූලාශ්‍රය දක්වමින් ධර්මාර්ථ විවරණය කිරීමේ ක්‍රමයෙහි ප්‍රභවස්ථානය බුදුන්වහන්සේගෙන් ම[66] ආරම්භ වූ අතර සැරියුත්, මහාකච්චායන ආදී සම්මුඛ ශ්‍රාවකවරු වර්ධනය කරනු ලැබූහ. එහි ලා විශේෂ භාවිතය මහාකච්චාන තෙරුන් වෙතින් ම හඳුනාගත හැකි වේ. පාලිසූත්තක අට්ඨකථා රචිත බුද්ධඝෝෂ ආදී අට්ඨකථාචාරීන් වහන්සේලාට අදාළ ස්ථානයෙහි ම මූලාශ්‍රය දැක්වීමේ ක්‍රමයේ මූලාදර්ශය ද සම්මුඛ ශ්‍රාවක මහාකච්චාන ආදී තෙරවරුන් මූලාශ්‍රය කොට තිබේ.

සද්ධර්මාරක්ෂක සම්මුඛ ශ්‍රාවක ගුරුකුලයේ දහ අටවැනි ස්ථානයෙහි ලා කලණ බස් තෙපලනුවන් අතරෙහි (කල්‍යාණවාක්කරණ) අගතැන් ලැබුවෝ[67] සෝණකුටිකණ්ණ තෙරණුවෝ ය. උන්වහන්සේ මහාකච්චාන තෙරුන්ගේ අන්තේවාසික ශිෂ්‍යයෙකි. මහාකච්චාන තෙරුන් වෙතින්

---

64 වුත්තමිදං භන්තෙ, භගවතා කුමාරි පඤ්හෙසු
අත්ථස්ස පත්තිං හදයස්ස සන්තිං
ජෙත්වාන සෙනං පියසාතරූපං
එකොහං ඣායං සුඛමනුබොධිං
තස්මා ජනෙන න කරොමි සක්ඛිං
සක්ඛී න සම්පජ්ජති කෙනචි මෙති.
අංගුත්තර නිකාය, VI. 86-88 පිටු.

65 වුත්තමිදං ආවුසො භගවතා පාරායනෙ මෙත්තෙය්‍ය පඤ්හෙ,
යො උභන්තෙ විදිත්වාන - මජ්ඣෙ මන්තා න ලිප්පති, තං බ්‍රූමි මහාපුරිසොති
- සො'ධ සිබ්බනි මච්චගා එම., IV, 186-188 පිටු.

66 ඉදං ච පන මෙතං ආනන්ද සන්ධාය භාසිතං පාරායණෙ පුණ්ණකපඤ්හෙ.
සංඛාය ලොකස්මිං පරොවරානි යනාදී ගාථාව (19)
ඉදං ච පන මෙතං සාරිපුත්ත සන්ධාය භාසිතං පාරායණෙ උදයපඤ්හෙ
පහානං කාම සඤ්ඤානං ආදී ගාථාව (20-21 ගාථා)

67 එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං කල්‍යාණවාක්කරණානං යදිදං සොණකුටිකණ්ණො. අංගුත්තර නිකාය, I. 46 පි.

පැවිදි උපසම්පදාව ලබා, කර්මස්ථාන ගෙන විදර්ශනා වඩා රහත් බවට පත්වූ බවත්, සිය උපාධ්‍යායන් වහන්සේ වෙතින් සුත්තනිපාතය උගෙන, බුදුරදුන් අබිමුව මධුරස්වරයෙන් අට්ඨකවර්ගීය සූත්‍රයන් සජ්ඣායනා කළ බවත්,[68] සඳහන් වේ. සෝණකුටිකණ්ණ තෙරුන්ගේ අට්ඨක වර්ගීය සූත්‍ර සජ්ඣායනය ඇසූ බුදුරදුන් සාධුකාර දුන් බවත්, මනාව සජ්ඣායනා කළ බවත්, තමන් වහන්සේ දේශනා කළ කාලයේ මුල් දේශනාවත්, අද සෝණ තෙරුන්ගේ දේශනාව සමාන බවත්, දේශනාවේ අඩු බවක් හෝ වැඩි බවක්

හෝ නැති බවත් පවසා ප්‍රසාදය පළ කළහ.[69] මෙහි සඳහන් අට්ඨකවර්ගයට සූත්‍ර දහසයක් අඩංගු වී තිබූ බව ද ථෙරගාථා අට්ඨකථාවේ[I] සඳහන් වේ.

මෙහි 'කල්‍යාණවාක්කරණ' යනු මධුර ස්වරයෙන්, මිහිරි වචනයෙන් ධර්ම කථා පැවසීම[70] යැයි ද සුන්දර වාග් කරණ, ලක්ෂණ, සම්පන්න වචන ක්‍රම[71] යැයි ද අර්ථ දක්වා තිබේ.

බුදුරදුන් දවස සුත්තනිපාතයත්, අට්ඨක වග්ගය හා පාරායණ වග්ගයත් හැදෑරීමේ ගුරුකුලයක් පැවති බවට සාධක මහාකච්චාන තෙරුන් හා සොණකුටිකණ්ණ තෙරුන් පිළිබඳ සිද්ධීන්ගෙන් සනාථ වේ. අංගුත්තරනිකායේ නන්දමාතු සූත්‍රය,[72] වේළුකණ්ටකී නන්දමාතා උපාසිකාව

---

68 සො අපරෙන සමයෙන ථෙරස්ස සන්තිකෙ පබ්බජි. ථෙරො තං උපසම්පාදෙතුකාමො තීනි වස්සානි ගණං පරියෙසිත්වා උපසම්පාදෙසි; සො උපසම්පන්නො කම්මට්ඨානං කථාපෙත්වා විපස්සනං වඩ්ඪෙත්වා අරහත්තං පත්වා ථෙරස්සෙව සන්තිකෙ සුත්තනිපාතං උග්ගණ්හිත්වා වුත්ථවස්සො පවාරෙත්වා සත්ථාරං පස්සිතුකාමො හුත්වා උපජ්ඣායං ආපුච්ඡි... සොණත්ථෙරො මධුරෙන සරෙන එකබ්‍යඤ්ජනම්පි අවිනාසෙන්තො අට්ඨක වග්ගියානි අභාසි.
අංගුත්තර නිකාය අට්ඨකථා, මනෝරථපූරණී I, 135-136 පිටු.

69 කථාපරියොසානෙ භගවා සාධුකාරං දත්වා සුග්ගහිතො තෙ භික්ඛු ධම්මො මයා දෙසිතකාලෙ ච අජ්ජ ච එක පදිසාව දෙසනා කිඤ්චි ඌනං වා අතිරිත්තං වා නත්ථීති පසන්නභාවං පකාසෙසි, එම., 136 පි.

70 කල්‍යාණවාක්කරණන්ති, වාක්කරණං වුච්චති වචන කිරියා; මධුර වචනානන්ති අත්ථො; අයංහි ථෙරො දසබලෙන එක ගන්ධකුටියා තථාගතස්ස මධුරසරෙන ධම්මකථං කථෙසි, අංගුත්තර නිකාය අට්ඨකථා, මනොරථපූරණී I, 133 පි.

71 කල්‍යාණ වාක්කරණොති, සුන්දරවචීකරණො ලක්ඛණ සම්පන්න වචනක්කමොති අත්ථො. ථෙරගාථා අට්ඨකථා, පරමත්ථදීපනී I, 431 පි.

72 එකං සමයං පන සමයෙන වෙළුකණ්ටකී නන්දමාතා උපාසිකා රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය පාරායණං සරෙන භාසති

රාත්‍රියේ පැසුළු යාමයේ සිට පාරායණ ධර්මය මධුර ස්වරයෙන් කී බවත්, වෙස්සවණ මහරජ එය අසා කථා අවසානයේ සතුටින් අනුමෝදනා වූ බවත් සඳහන් වේ. සුත්තනිපාතයේ අට්ඨක හා පාරායණ වර්ගීය සූත්‍ර මධුර ස්වරයෙන් සජ්ඣායනා කිරීම, බුදුරදුන් දවස පැවති උසස් සමාජ සම්මතයක් විය හැකි ය. මෙසේ නමුත් සද්ධර්මාරක්‍ෂක ගුරුකුලයේ සම්මුඛ ශ්‍රාවකයන්ගේ ධර්මය උද්ග්‍රහණ - ධාරණ ක්‍රමවේදයේ වැදගත් ම ලක්‍ෂණය සජ්ඣායනය බව සැලකිය හැකි ය.

සද්ධර්මාරක්‍ෂක සම්මුඛ ශ්‍රාවක ගුරුකුලයේ තෙරවරුන් ලෙස මිහිරි කටහඬ ඇති භික්ෂූන් අතර අගතැන් ලැබූ ලකුණ්ඨකභද්දිය[73] තෙරුන් ද, පිළිපුන් වැටහීම ඇති (පටිභානවන්තානං) භික්ෂූන් අතර අගතැන් ලැබූ වංගීස තෙරුන් [74] ද ධර්ම දේශනා ප්‍රතිභානයට ප්‍රත්‍යවන කථා ඇති (පටිභාණෙය්‍යකානං) රාධ තෙරුන් [75] ද විසිතුරු ධර්ම කථා ඇති (චිත්තකථිකානං) කුමාර කාශ්‍යප තෙරුන් [76] ද සැලකිය හැකි ය. ධර්මය දැරීම, ධර්මය වැටහීම, ධර්මය දේශනා කිරීම යන කරුණුවල විශේෂතා සලකා ම බුදුරදුන් විසින් අගතැන්හි තනතුර ලබා දුන් බව පිළිගැනීම යුක්ති යුක්ත වේ.

විනයාරක්‍ෂක සම්මුඛ ශ්‍රාවක ගුරුකුලයේ විනයධර භික්ෂූන් අතර අග්‍රස්ථානය ලැබුයේ උපාලි තෙරණුවෝ [77] ය. උන්වහන්සේ බුදුරදුන් වෙතින් වාසධුරය හා ග්‍රන්ථධුරය සම්පූර්ණ කොට, කමටහන් ගෙන විදර්ශනා වඩා රහත් බවට පත්වූ බවත්, බුදුරදුන් වෙතින් ම සියලු විනය පිටකය උගෙන ගත් බවත් [78] අටුවාචාරීන් වහන්සේ පවසති. බුදුරදුන් දවස ම විනයාරක්‍ෂක

---

අජ්ඣොසි ඛො වෙස්සවණො මහාරාජා නන්දමාතාය උපාසිකාය පාරායණං සරෙන භාසන්තියා... අංගුත්තර නිකාය, IV, 372 පි.

73 එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං මඤ්ජුස්සරානං යදිදං ලකුණ්ඨක භද්දියො අංගුත්තර නිකාය, I, 46 පි

74 පටිභානවන්තානං යදිදං වංගීසො එම., 48 පි.

75 පටිභාණෙය්‍යකානං යදිදං රාධො, එම.,

76 චිත්තකථිකානං යදිදං කුමාරකස්සපො. එම.,

77 එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං විනයධරානං යදිදං උපාලි. අංගුත්තර නිකාය, I, 48 පි.

78 අම්හාකං පන සත්ථුනො වසන්තස්ස වාසධුරඤ්ච ගන්ථධුරඤ්ච පරිපූරෙස්සතීති, ථෙරො සත්ථු වචනං සම්පටිච්ඡිත්වා විපස්සනාය කම්මං කරොන්තො න චිරස්සෙව අරහත්තං පාපුණි. අථ නං සත්ථා සයමෙව සකල විනය පිටකං උග්ගණ්හාපෙසි. අංගුත්තර නිකාය අට්ඨකථා, මනෝරථපූරණී I, 172 පි.

ගුරුකුලයේ විනයධර භික්ෂූන් වහන්සේගෙන් සැදුම්ලත් 'විනය ගණ' පැවති බවට සාධක පවතී. මහාකච්චාන තෙරුන්ගේ අන්තේවාසික සෝණ කුටිකණ්ණ තෙරුන්, විනයධර පඤ්චම ගණයෙන් උපසම්පදාව ලැබූ බව අටුවාචාරීහු[79] පවසති.

බුද්ධත්වයෙන් නව වැනි (09) වස්කාලය වන විටත්, ධර්මාරක්ෂක ධර්මධර ගුරුකුලයත්, විනයාරක්ෂක විනයධර ගුරුකුලයත් පැවති බව කොසම්බක වස්තුවෙන්[80] තහවුරු වේ. කොසඹෑ නුවර ඝෝෂිතාරාමයේ පන්සියයක් භික්ෂූන් පිරිවැරූ විනයධර තෙරනමක් ද පන්සියයක් භික්ෂූන් පිරිවැරූ ධම්මකථික තෙරනමක් ද ගුරුකුල දෙකකට අයත් භික්ෂූහු වූහ. විනයධර හා ධම්මකථික තෙරවරුන් දෙපළ නායකත්වය ලබා දුන් දහසක් භික්ෂූන්ගෙන් යුක්ත ගුරුකුල දෙකක් ලෙස සැලකීම වඩාත් යෝග්‍ය වේ.

කීටාගිරියෙහි විසූ අස්සජි - පුනබ්බසුක භික්ෂූන් වහන්සේ දෙනම අලජ්ජීව පාපක්‍රියාවන්හි යෙදීම හේතුවෙන් බුදුන්වහන්සේ 'පබ්බාජනීය කර්මය' (පබ්බජනීය කම්මං)[81] පැනවූහ. එහි ලා ඇතුළත් ව සෙය්‍යසක මහණහට මහතෙර කෙනෙකුන් ඇසුරු කොට විසිය යුතු යැයි නියස්සකර්මය ද කෙළේය. මෙහි සඳහන් මහතෙර නමක් ඇසුරු කිරීමේ සුවිශේෂතා 5 ක් ප්‍රකාශ වේ.

එනම්, සේවනය කිරීම (සෙවමානො), භජනය කිරීම (භජමානො), ඇසුරු කිරීම (පයිරුපාසමානො), උද්දෙසනය කිරීම (උද්දිසාපෙන්තො), නැවත නැවත විචාරීම (පරිපුච්ඡන්තො) යි. කල්‍යාණ මිත්‍ර මහතෙර නමක් යටතේ නිස්සය සමාදන් ව විසීමෙන්, ධර්ම විනයෙහි මනා ශික්ෂණය ඇති කරලීම මෙහි අභිප්‍රාය වේ. ධර්ම විනය උද්දේසනයෙන්, විචාරණයෙන් ඇසුරු කරන භික්ෂු නම බහුශ්‍රැතයෙකු වන බවත්,[82] කියැවේ. මෙහි උක්ත

79 සොණත්ථෙරොපි අයං ඛො සොණො සල්ලක්ඛෙත්වා උපජ්ඣායස්ස වචනෙන දසබලං වන්දිත්වා විනයධරපඤ්චමෙන ගණෙන උපසම්පදං ආදිං කත්වා සබ්බමෙව යාචි.
අංගුත්තර නිකාය අට්ඨකථා, මනෝරථපූරණී I, 136 පි.
ථේරගාථා අට්ඨකථා, පරමත්ථදීපනී I, 430 පි.

80 කොසම්බියං හි ඝොසිතාරාමෙ පඤ්චසතපඤ්චසත පරිවාරා ද්වෙ භික්ඛූ විහරිංසු විනයධරො ච ධම්මකථිකො චාති, ධම්මපදට්ඨකථා I, 27 පි.

81 චුල්ලවග්ගපාළි, I, 34 පි.

82 සො සංඝෙන නියස්සකම්මකතො කල්‍යාණ මිත්තෙ සෙවමානො භජමානො පයිරුපාසමානො උද්දිසාපෙන්තො පරිපුච්ඡන්තො බහුස්සුතො හොති.

බහුශ්‍රැතභාවය හැඟවීම සඳහා භාවිත විශේෂණ පාලි ප්‍රයෝග රැසකි. එනම්, ආගතාගමො - (වාචොද්ගත කොට ගත් ආගමය ඇති) ධම්මධරො (ධර්මධර), විනයධරො (විනයධර), මාතිකාධරො (මාතිකාධර) පණ්ඩිතො (පණ්ඩිත) ව්‍යත්තො (ව්‍යක්ත), මෙධාවී (ප්‍රඥාවත්), ලජ්ජී (ලැජ්ජා ඇති), කුක්කුච්චකො (සුළුවරදෙහි කුකුස් කරන), සික්ඛාකාමො (ශික්ෂාකාමී) යනු යි. භික්ෂූන් වහන්සේගේ බහුශ්‍රැතභාවය, ත්‍රිපිටක පාලිය වාචෝද්ගත කිරීම තුළ තහවුරු වන බවත්, උන්වහන්සේ ත්‍රිවිධ ශාසනයෙහි ශික්ෂණය ලැබුවෙකු බවත් මින් අර්ථවත් වේ.

බුදුන් වහන්සේ පරිනිර්වාණ සමයේ දී ද භික්ඛු, භික්ඛුණී, උපාසක, උපාසිකා යන සිවුවනක් පිරිස තුළ ම බහුශ්‍රැතභාවයත්, ස්වකීය ආචාර්යවාදය උගෙන දේශනා කිරීමත්, උපන් පරප්‍රවාද කරුණු සහිත ව මැඩ පැවැත්වීමත් [83] අපේක්ෂා කළහ. ස්වකීය ශ්‍රාවකයා තුළ පිහිටිය යුතු බහුශ්‍රැතභාවය ප්‍රකාශ වන්නේ, වියත්තා, විනීතා, විසාරදා, බහුස්සුතා, ධම්මධරා, ධම්මානුධම්ම පටිපන්නා, සාමීචිපටිපන්නා, අනුධම්මචාරිනො යන පාලි ප්‍රයෝග රැසකිනි. ස්වකීය ආචාර්යවාදය උගෙන දේශනා කිරීමේ කුසලතාව ප්‍රකාශ වන්නේ, ආචික්ඛිස්සන්ති, දෙසෙස්සන්ති, පඤ්ඤපෙස්සන්ති, පට්ඨපෙස්සන්ති, විවරිස්සන්ති, විභජිස්සන්ති, උත්තානි කරිස්සන්ති යන ප්‍රයෝග පද හතකිනි. මේ යෙදුම් සියල්ල තුළින් කුළු ගැන්වෙන්නේ, ධර්මාරක්ෂක හා විනයාරක්ෂක සම්මුඛ ශ්‍රාවක ගුරුකුලයේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය යි.

බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයකින් පසු ශාසනයෙහි පැනනැගි අධිකරණය විනිශ්චයෙහි ලා පවත්වනු ලැබූ 'සත්තසතිකා' විනය සංගීතියෙහි[84] අධිකරණ පරීක්ෂාවට ස්ථවිර භික්ෂූන් විසින් තෝරා ගත් සෝරෙය්‍ය නගරයේ

---

ආගතාගමො ධම්මධරො විනයධරො මාතිකාධරො පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී ලජ්ජී කුක්කුච්චකො සික්ඛාකාමො. චුල්ලවග්ගපාලි, I, 38 පි.

83 න තාවාහං පාපිම පරිනිබ්බායිස්සාමි යාව මෙ භික්ඛූ සාවකා භවිස්සන්ති. වියත්තා විනීතා විසාරදා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනො, සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති දෙසෙස්සන්ති පඤ්ඤපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානීකරිස්සන්ති, උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහීතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙස්සන්තීති. දීඝනිකාය, II, මහාපරිනිබ්බාන සුත්ත, 162-166 පිටු.

84 ඉමාය ඛො පන විනය සංගීතියා සත්ත භික්ඛුසතානි අනූනානි අනධිකානි අහෙසුං. තස්මායං විනයසංගීති සත්තසතිකාති වුච්චතීති. චුල්ලවග්ගපාලි, II, 598 පි.

වැඩ විසූ ආයුෂ්මත් රේවත තෙරුන් වහන්සේ විශේෂණ පද රැසකින් හැඳින්වූ බහුශ්‍රැත පඬිවරයෙකි.[85] පූර්වෝක්ත විශේෂණ පදයන්ට අතිරේක ව ආගතාගමො, විනයධරො, මාතිකාධරො යන විශේෂණ පද ද ඇත රේවත තෙරුන් සඳහා භාවිත වේ.[86] රේවත තෙරුන්ගේ සහභාගීත්වය ද සිදුවන්නේ, ස්ථවිර භික්ෂූන්ගේ මන්ත්‍රණය මිනිස් බව ඉක්ම වූ විශුද්ධ වූ දිව්‍යකනින් අසා ය. සද්ධර්මාරක්‍ෂක හා විනයාරක්‍ෂක සම්මුඛශ්‍රාවක ගුරුකුලයේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර විසින් පවත්වාගෙන පැමිණි අයුරු මින් තහවුරු වේ. බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයකට පසුව ද උක්ත විශේෂණයන්ගෙන් හැඳින්වේ. ධර්ම විනයෙහි බහුශ්‍රැත පඬිවරුන්ගේ ගුරුකුලය ශක්තිමත් ව හා බලවත් ව පැවති බව ද සැලකිය හැකි ය.

බුදුන් වහන්සේ වෙතින් ම විනය උගෙන විනයධර භික්ෂූන් අතර අගතැන් ලැබූ උපාලි තෙරණුවෝ ම පඤ්චසතිකා විනය සංගීතියෙහි[87] මහා කාශ්‍යප තෙරුන් වහන්සේ විචාළ විනය ගැටලු ද විසඳාලූහ. මෙසේ විනය සංගායනා කොට, විනය පිටකය ආරක්ෂා කිරීමේ හා පවත්වාගෙන යෑමේ වගකීම ද උන්වහන්සේ හා උන්වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර වෙතට ම්[88] භාර කරනු ලැබීය. විනයාරක්‍ෂක සම්මුඛ ශ්‍රාවක ගුරුකුලයේ ප්‍රමුඛ වූ උපාලිතෙරුන් හා උන්වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර දඹදිව ද විනය පිටකය ආරක්ෂා කොට ලක්දිවට රැගෙන ඒමෙන් පසුව ද මහාමහින්ද අරිට්ඨ ආදී[89] තෙරවරුන් ආරක්ෂා කළ බව ද සඳහන් වේ.

---

85 තෙන ඛො පන ආයස්මා රෙවතො සොරෙය්‍යෙ පටිවසති බහුස්සුතො ආගතාගමො ධම්මධරො විනයධරො මාතිකාධරො පණ්ඩිතො ව්‍යත්තො මේධාවී ලජ්ජී කුක්කුච්චකො සික්ඛාකාමො. එම., 576-578

86 අස්සොසි ඛො ආයස්මා රෙවතො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය ථෙරානං භික්ඛූනං මන්තයමානානං සුත්වානස්ස එතදහොසි. එම., 576 පි.

87 ඉමාය ඛො පන විනය සංගීතියා පඤ්ච භික්ඛු සතානි අනූනානි අනධිකානි අහෙසුං. තස්මා අයං විනයසංගීති පඤ්චසතිකාති වුච්චති. චුල්ලවග්ගපාලි. II. 546 පි.

88 විනය පිටකාවසානෙපි වුත්තනයෙනෙව පටිපජ්ජිතබ්බයො අහොසි. තං ආයස්මන්තං පටිපුච්ඡාපෙසුං 'ආවුසො ඉමං තුය්හං නිස්සිතකෙ වාචෙහීති විනය පිටක සංගහාවසානෙ උපාලිත්ථෙරො දන්තඛචිත විජනිං නික්ඛිපිත්වා ධම්මාසනා ඔරොහිත්වා ථෙරෙ භික්ඛූ වන්දිත්වා අත්තනො පත්තාසනෙ නිසීදි. දීඝනිකාය අට්ඨකථා, සුමංගලවිලාසිනී I, 10 පි.

89 ජම්බුදීපෙ තාව උපාලිත්ථෙරමාදිං කත්වා ආචරිය පරම්පරාය යාව තතියසංගීති තාව ආභතං. තත්‍රායං ආචරියපරම්පරා

සද්ධර්මාරක්ෂක සම්බුද්ධශ්‍රාවක ගුරුකුලයේ ශ්‍රාවිකා භූමිය නියෝජනය කළ ධම්මදින්නා තෙරණිය ධර්මකථික භික්ෂුණීන් [90] අතර ද, ඛේමා තෙරණිය මහා ප්‍රාඥ භික්ෂුණීන් [91] අතර ද අගතැන් ලැබූහ. ධම්මදින්නා භික්ෂුණීන් වහන්සේගේ ධර්මාර්ථ විභාගය ශ්‍රාවක පිරිස්වල ප්‍රසාදයත්, බුදුරදුන්ගේ ප්‍රශංසාවටත් ලක්වූවකි. මජ්ඣිමනිකායේ චූලවේදල්ල සූත්‍රය, මෙයට කදිම සාධකයකි. විසාඛ උපාසක තෙමේ ධම්මදින්නා තෙරණිය වෙත පැමිණ, බුදුරදුන් වදාළ, 'සක්කාය - සක්කාය'[92] යන ධර්මෝද්දේශයට ධර්මාර්ථ කවරේ දැයි විමසයි. ධම්මදින්නා තෙරණියෝ 'පඤ්ච උපාදානස්කන්ධ සක්කාය' යැයි බුදුරදුන් විසින් වදාළ බව ප්‍රකාශ කොට එක් එක් කරුණ ගෙන ධර්මාර්ථ විභාග කොට දක්වති. එම ධර්මාර්ථ විභාගය පෙළෙහි එන ධර්මාර්ථ ව්‍යාඛ්‍යාන ලක්ෂණ ප්‍රකට කෙරෙන ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස විද්වත්හු[93] සලකති. ධම්මදින්නා තෙරණියගේ ධර්මාර්ථ විභාගය, විසාඛ උපාසක බුදුරදුන් ඉදිරියේ ප්‍රකාශ කිරීමෙන් පසු ප්‍රශංසාවට ලක්වේ. ධම්මදින්නා තෙරණිය පණ්ඩිත බවත්, මහාප්‍රාඥ බවත් වදාරන

---

උපාලි දාසකො චෙව - සොණකො සිග්ගවො තථා,
තිස්සො මොග්ගලිපුත්තොච - පඤ්චෙතෙ විජිතාවිනො.
පරම්පරාය විනයං - දීපෙ ජම්බු සිරිව්හයෙ,
අච්ඡිජ්ජමානං ආනෙසුං - තතියො යාව සංගහොති
තස්සත්ථො එත්තාවතා පකාසිතොව හොති. තතිය සංගහතො පන උද්ධං ඉමං දීපං මහින්දාදීහි ආහතං මහින්දතො උග්ගහෙත්වා කඤ්චි කාලං අරිට්ඨත්ථෙරාදීහි ආහතං. තතො යාව අජ්ජතනා තෙසං යෙව අන්තෙවාසික පරම්පරාභූතාය ආචරිය පරම්පරාය ආභතන්ති වෙදිතබ්බං.
තතො මහින්දො ඉට්ටියො - උත්තියො සම්බලොපිච, භද්දනාමොච පණ්ඩිතො...
එතෙ නාගා මහාපඤ්ඤා - විනයඤ්ඤූ මග්ගකොවිදා
විනයං දීපං පකාසෙසුං - පිටකං තම්බපණ්ණියාති
විනය අට්ඨකථා, සමන්තපාසාදිකා I, 35-36 පිටු.

90 එතදග්ගං භික්ඛවෙ මම සාවිකානං භික්ඛුණීනං, ධම්මකථිකානං යදිදං ධම්මදින්නා.
අංගුත්තර නිකාය, I, 50 පි.

91 එතදග්ගං භික්ඛවෙ මම සාවිකානං භික්ඛුණීනං, මහා පඤ්ඤානං යදිදං ඛෙමා.
එම.,

92 සක්කායො සක්කායොති අය්‍යෙ වුච්චති, කතමො නු ඛො අය්‍යෙ සක්කායො වුත්තො භගවතාති? මජ්ඣිම නිකාය, I, 702 පි.

93 පාලි අට්ඨකථා සාහිත්‍ය, 21-22 පිටු, පාලි අට්ඨකථාවන්හි බිහිවීම හා ව්‍යාකරණ සම්ප්‍රදාය, 21-22 පිටු, 20-21 පිටු.

බුදුරදුන්[94] එම කරුණු විචාරීමේ දී බුදුරදුන් ද එසේම විවරණය කරන බවත්, ධම්මදින්නාවගේ ධර්මාර්ථ විභාගය, තමන් වහන්සේගේ අර්ථය ද එය ම බවත් පවසති.

ඛේමා තෙරණියගේ ධර්මාර්ථ විභාගය ද ශ්‍රාවකයාගේ ප්‍රසාදය දිනාගත්තකි. සංයුත්තනිකායේ ඛේමා සූත්‍රය,[95] ඊට කදිම නිදසුනකි. පසේනදි කොසොල් රජතුමා "ආර්යාවනි, කිමෙක්ද සත්වයා මරණින් මතුවේ දැයි? - කින්නු ඛො අය්‍යෙ හොති තථාගතො පරම්මරණාති...?" යනුවෙන් ඇසූ ප්‍රශ්නයට කරනු ලැබූ ධර්මාර්ථ විවරණයකි. උක්ත දේශනය ඇසූ රජතුමා බුදුරදුන් ඉදිරියේ 'ස්වාමීනි, ආශ්චර්යයකි.' යම් හෙයකින් දේශනයෙහි ලා ශාස්තෘන් වහන්සේගේ ද ශ්‍රාවිකාවගේ අර්ථයෙන් අර්ථය ව්‍යඤ්ජනයෙන් ව්‍යඤ්ජනය සැසඳේද සමවේද විරුද්ධ නො වේද එහෙයිනි, යැයි ඛේමා තෙරණියගේ දේශනයත් බුදුරදුන්ගේ ධර්මාර්ථ විභාගයත් සසඳා ප්‍රකාශ කරයි.

අංගුත්තරනිකායේ දුතිය මහාපඤ්හ සූත්‍රය,[96] තුළ සද්ධර්මාරක්ෂක සම්මුඛ ශ්‍රාවක-ශ්‍රාවිකා ගුරුකුලයේ වැදගත් සාමාජිකාවක ලෙස කජංගලා භික්ෂුණිය පිළිබඳ තොරතුරු විවරණ වේ. බොහෝ කජංගලා උපාසක පිරිසක් කජංගලා භික්ෂුණිය වෙත පැමිණ, බුදුරදුන් විස්තර විභාග නො කළ සංක්ෂිප්ත ධර්මෝද්දේසයට විස්තර විභාග විචාරති. එහි ලා කජංගලා භික්ෂුණිය ද බුදුරදුන් විසින් ද භික්ෂූන් වහන්සේ විසින් ද නො ඇසූ ධර්මාර්ථ විභාගයක් තමා පවසන බව කියයි.[97] කජංගලා භික්ෂුණියගේ ධර්මාර්ථ විභාගය ඇසූ එම උපාසක පිරිස බුදුරදුන් වෙත ගොස් ඒ බව ප්‍රකාශ කරති. බුදුන් වහන්සේ එහි ලා 'ගැහැවියෙනි, මැනවි, කජංගලා භික්ෂුණිය

---

94 එවං වුත්තෙ භගවා විසාඛං උපාසකං එතදවොච: පණ්ඩිතා විසාඛ ධම්මදින්නා භික්ඛුණී, මහාපඤ්ඤා විසාඛ ධම්මදින්නා භික්ඛුණී. මඤ්චෙපි ත්වං විසාඛ එතමත්ථං පුච්ඡෙය්‍යාසි, අහම්පි තං එවමෙවං බ්‍යාකරෙය්‍යං යථා තං ධම්මදින්නාය භික්ඛුනියා බ්‍යාකතං. එසො චෙවෙතස්ස අත්ථො. එවමෙතං ධාරෙහීති. මජ්ඣිම නිකාය, I, 716 පි.

95 අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, යත්‍ර හි නාම සත්ථුචෙව සාවිකාය ච අත්ථෙන අත්ථො ව්‍යඤ්ජනෙන ව්‍යඤ්ජනං සංසන්දිස්සති සමෙස්සති න විහායිස්සති යදිදං අග්ගපදස්මිං. සංයුත්ත නිකාය, IV, 676 පි.

96 අංගුත්තර නිකාය, VI, 100 පි.

97 න ඛො පනෙතං ආවුසො, භගවතො සම්මුඛා සුතං, සම්මුඛා පටිග්ගහිතං. නපි මනොභාවනීයානං භික්ඛූනං සම්මුඛා සුතං, සම්මුඛා පටිග්ගහිතං, අපිච යථා මෙත්ථ ඛායති, තං සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති. එම..

පණ්ඩිතය, මහා පැනැතියක' යැයි වර්ණනා කළහ.[98] කජංගලා භික්ෂුණියගේ ධර්මාර්ථ විභාගය 'තමන් වහන්සේගේ විවරණයත් එය ම වන්නේය' යැයි ද එහෙයින් එය ම දරව් යැයි බුදුරදහු ප්‍රකාශ කළහ. උක්ත විමර්ශනය තුළින් ප්‍රකට වන්නේ සද්ධර්මාරක්ෂක විනයාරක්ෂක සම්මුඛ ශ්‍රාවක ගුරුකුල දෙකක් ක්‍රියාත්මක වූ බවත්, පසුකාලීන ව විද්‍යමාන භාණක සම්ප්‍රදායේ නියෝජනය බුද්ධකාලීන ව සම්මුඛ ශ්‍රාවකවරුන් දක්වා අතීතයට ගෙන යා හැකි බවත් තහවුරු වන බව යි.

98 සාධු, සාධු ගහපතයො, පණ්ඩිතා ගහපතයො කජංගලා භික්ඛුණී මහාපඤ්ඤා ගහපතයො කජංගලා භික්ඛුණී. එම., 106 පි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


- අංගුත්තර නිකාය, - චතුක්ක නිපාත, බු.ජ.මු. 19, ලංකාණ්ඩු ප්‍රකාශනය, 1962.
- චුල්ලවග්ගපාලි, දුතිය භාගය, බු.ජ.මු. මාලා (52), ශ්‍රී ලංකා සමාජවාදී ජනරජ ප්‍රකාශනය, 1983.
- ථෙරීගාථා පාලි, බු.ජ.මු, නැවත මුද්‍රණය, 2006.
- දීඝනිකාය, සීලක්ඛන්ධ වග්ග, බු.ජ.මු. 07, ලංකාණ්ඩු ප්‍රකාශනය, 1962.
- දීඝනිකාය අට්ඨකථා (සිංහල පරිවර්තන) බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රකාශනය, 2008.
- ධම්මපදය, මොරොන්තුඩුවේ ධම්මානන්ද හිමි සංස්. මහාබෝධි යන්ත්‍රාල මුද්‍රණය, 1928.
- ධම්මපද අට්ඨකථා, සයිමන් හේවාවිතාරණ සංස්. 1922.
- ධම්මසංගණිප්පකරණ, බු.ජ.මු., නැවත මුද්‍රණය, 2006.
- මජ්ඣිමනිකාය, මූලපණ්ණාසකය, බු.ජ.මු. 10, ලංකාණ්ඩු ප්‍රකාශනය, 1962.
- එම, මජ්ඣිම පණ්ණාසකය, බු.ජ.මු. 11, ලංකාණ්ඩු ප්‍රකාශනය, 1973.
- එම, උපරි පණ්ණාසකය, බු.ජ.මු. 11, ලංකාණ්ඩු ප්‍රකාශනය, 1973.
- සමන්තපාසාදිකා, පළමු භාගය, වැලිවිටියේ සෝරත හිමි සෝධනය, ත්‍රිපිටක මුද්‍රණාලය, 1929.
- සංයුත්තනිකාය, I, II, III, IV, V, බු.ජ.මු, නැවත මුද්‍රණය, 2006.
- සාරත්ථදීපනී, තිස්සව දේවරක්ඛිත හිමි ශෝධනය, වී.සී. වික්‍රමසිංහ ප්‍රකාශනය, 1914.
- සාරත්ථප්පකාසිනී, සයිමන් හේවාවිතාරණ සංස්., 1930.
- සුත්තනිපාතය, බු.ජ.මු. මාලා 26, ශ්‍රී ලංකා සමාජවාදී ජනරජ ප්‍රකාශන, 1977.
- සුමංගලවිලාසිනී, සයිමන් හේවාවිතාරණ සංස්. ත්‍රිපිටක මුද්‍රණාලය, 1925.

ද්විතීයික මූලාශ්‍රය


- අදිකාරම්, ඊ.ඩබ්., පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, කොළඹ, 1963.
- අබේනායක, ඔලිවර්, මහමිතව පඤ්ඤාරතන හිමි සංස්., පාලි අධ්‍යයන විමර්ශන, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රයේ ප්‍රකාශනය, 2009.
- අරියවංස හිමි, තුඩාවේ, ත්‍රිපිටක පාලි සංවණ්ණනා, මෝ.ද. ජයවර්ධන ප්‍රකාශනය, 1970.
- ඉන්දරතන හිමි, හත්තොටුවේ, පාලි අට්ඨකථා සාහිත්‍යයෙන් හෙළිවන අවිද්‍යමාන වූ සීහළට්ඨකථා සාහිත්‍යය, කර්තෘ ප්‍රකාශනය, 2006.
- උදිත හිමි, හිත්තැටියේ, ත්‍රිපිටක පරීක්ෂණය, එඩ්වින් ගුණසිංහ ප්‍රකාශනය, 1956.
- Geiger, Wilhelm, *Pali Literature and Language,* Translated by Batakrishna GhÈh, Munshiram Monohar Lal PublisheÍ, Calcuta, 1978.
- චන්දරතන හිමි, ලබුහේන්ගොඩ, පාලි අට්ඨකථා සාහිත්‍යය, ධාරා පාලි සඟරා සම්පාදක මණ්ඩලයේ ප්‍රකාශනය, 1968.
- Norman, K. R., *A History of Indian Literature,* Cambridge, 1982.
- පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ (පරි.) පාලි සාහිත්‍යයේ ඉතිහාසය, එස්. ගොඩගේ ප්‍රකාශනය, 2003.
- පියරතන හිමි, වැගම, පාලි අට්ඨකථාවන්හි පිළිබිඹුවන ව්‍යාකරණ සම්ප්‍රදාය, සමයවර්ධන ප්‍රකාශනය, ද්විතීය මුද්‍රණය, 2000.
- මලලසේකර, ජී. පී., ලංකා පාලි සාහිත්‍යය, එම්.ඩී. ගුණසේන ප්‍රකාශනය, 1965.
- Ibid, *The Pali Literature of Ceylon,* London, 1928.
- Rahula Thero, Walpola, *Humour in Pali literature and other essay,* Rahula Foundation 1997.
- ලංකානන්ද හිමි, ලබුගම, ශාස්ත්‍රීය ලේඛන සංග්‍රහය, එම්.ඩී. ගුණසේන ප්‍රකාශනය, 1968.
- විමලවංස හිමි, බද්දේගම, බෞද්ධ සාහිත්‍යය, අතුල මුද්‍රණාලය, කොළඹ 1955.
- සරණංකර හිමි, ගණේගම, (පරි.) අර්ථකථාචාර්ය බුද්ධඝෝෂ, ඇල්බට් එදිරිසිංහ ප්‍රකාශනය, 1963.

- සිරිසුමන හිමි, මාවුස්සාගොල්ලේ, බෞද්ධ සංස්කෘතිය හා බුද්ධඝෝෂ හිමි, ඇම්.ඩී. ගුණසේන ප්‍රකාශනය, 1960.


කෝෂ ග්‍රන්ථ හා වාර සඟරා


- අභිධානප්පදීපිකා, මොරගොල්ලේ ඤාණෝභාසතිස්ස හිමි, එම්.ඩී. ගුණසේන සමාගම, 1960.
- Dictionary of Pali Language, Robert Cesar Childreſ, Asian Educational Services, New Delhi, Madras, 1993.
- පාලි සිංහල අකාරාදිය, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, එම්.ඩී. ගුණසේන සමාගම, ද්විතීය මුද්‍රණය, 1960.
- පාලි සිංහල ශබ්ද කෝෂය, මඩිතියවෙල සිරි සුමංගල හිමි, එම්.ඩී. ගුණසේන සමාගම, 1965.
- පාලි ශබ්දකෝෂය, ගුණපාල විරසේකර, එම්.ඩී. ගුණසේන සමාගම, 1968.
- ව්‍යාකරණ සද්ද සින්ධු, විදුරුපොල පියතිස්ස හිමි, 1929.
- ශබ්දස්තෝම මහානිධි, තෙවැනි සංස්කරණය, කලිකාතානගර, 1963.
- ශාස්ත්‍රීය සංග්‍රහය, 2000, ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමිතිය, 2000.
- ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, දෙවැනි භාගය, වැලිවිටියේ සෝරත නාහිමි, අනුල යන්ත්‍රාලය, මරදාන, 1956.


වාරසඟරා හා ලිපි


- අදිකාරී, අබයරත්න, සම්භාව්‍ය ලේඛනය හා ව්‍යාකරණ සම්ප්‍රදායයෝ, සම්භාෂා 06 කලාපය, විජිත බෙලිගහදර සංස්., උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ඒකකයේ ප්‍රකාශනය, 1996, 7-23 පිටු.
- අබේනායක, ඔලිවර්, පාලි ත්‍රිපිටකය පෝෂණය කිරීම විෂයයෙහි ශ්‍රී ලාංකේය දායකත්වය, බුදුසමයේ ලාංකේය වර්ධනය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල ප්‍රකාශනය 01, 1995, 33-53 පිටු.
- එම්, බුද්ධඝෝෂ හිමියෝ, චරිතය හා සාහිත්‍ය සේවාව පිළිබඳ අධ්‍යයනයක්, පාලි අට්ඨකථා සාහිත්‍යය අධ්‍යයන ප්‍රවේශය, පිදීගම චන්දරතන හිමි සංස්. පිදී විහාර තරුණ බෞද්ධ සංගමයේ ප්‍රකාශනය, 2012, 88-104 පිටු.

- අරියවිමල හිමි, කොස්වත්තේ, **ත්‍රිපිටකයේ අටුවා ලක්ෂණ විවරණ**, ධර්ම ශාස්ත්‍රීය ලිපි සමුච්චය, මහමිතව පඤ්ඤාරතන හිමි, සංස්., සාරස ප්‍රකාශනය, 2009, 579-589 පිටු.
- ඔලිවර් පී. එච්., **අට්ඨකථාකරුවන් සාහිත්‍ය සේවයේදී ලද ස්තුති ප්‍රශංසා හා සත්කාර සම්මාන**, ධාරා 07 කලාපය, කරුණාරත්න රණසිංහ සංස්., පාලි සඟරා සම්පාදක මණ්ඩලය, 1964, 75-90 පිටු.
- කරුණාදාස, වයි., **පාලි සාහිත්‍යය, අපේ සංස්කෘතික උරුමය**, ද්විතීය කාණ්ඩය, මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රකාශනය, 1998, 11-41 පිටු.
- Gunasekera, Lakshmi, R., **Atthakatha,** Encyclopeadia of Buddhism, Vol. II, . P. Malalasekera, 1966, Pages 335-352.
- චන්දරතන හිමි, ලබුහේන්ගොඩ, පාලි අට්ඨකථා සාහිත්‍යය, ප්‍රඥාසාර ප්‍රශස්ති, බඹරැන්දේ සිරි සීවලී හිමි, සංස්., විද්‍යාලංකාර මුද්‍රණාලය, 1966, 120-156 පිටු.
- ජයවික්‍රම, එන්.ඒ., **බුද්ධඝෝෂ හිමි හා පාලි ත්‍රිපිටකයේ පරම්පරාගත වර්ග කිරීම**, ධාරා 10 කලාපය, කුඹුරුගමුවේ වජිර හිමි සංස්., ධාරා පාලි සඟරා සම්පාදක මණ්ඩලය, 1965, 13-35 පිටු.
- එම, පාලි සාහිත්‍ය කෘති සම්පාදනය, ලංකාවේ අධ්‍යාපනය, සියවස ප්‍රකාශනය, ශ්‍රී ලංකා අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ ප්‍රකාශනය, රජයේ මුද්‍රණාලය, 1995, 57-70 පිටු.
- ධීරසේකර, ජෝතිය, **බුද්ධඝෝෂ හිමි සහ ප්‍රථම සංගායනාව පිළිබඳ පාරම්පරික මතය**, ධාරා 06 කලාපය, ලබුහේන්ගොඩ චන්දරතන හිමි සංස්, ධාරා පාලි සඟරා සම්පාදක මණ්ඩලය, 1964, 30-41 පිටු.
- පාණ්ඩෙ, ජී.සී. **බෞද්ධ ත්‍රිපිටකය හා එහි කාල නිර්ණය**, (පරි.) ධාරා රීස් ඩේවිඩ්ස් අංකය, විග ඤාණාලෝක හිමි, සංස්., පාලි සඟරා සම්පාදක මණ්ඩලය, 1962, 106--133 පිටු.
- පියදාස, ඩී.ඩී., **බුද්ධඝෝෂ නිරුක්ති**, ධාරා 10 කලාපය, කුඹුරුගමුවේ වජිර හිමි සංස්., ධාරා පාලි සඟරා සම්පාදක මණ්ඩලය, 1965, 86-98 පිටු.
- පියරතන හිමි, දෙමලුස්සේ, **පාලි ගද්‍යය හා පාලි භාෂාවේ ජන්ම භූමිය**, සාරදා, මංගල කලාපය, අල්ගොඩ සුදස්සන හිමි සංස්., පාලි සංගමයේ ප්‍රකාශනය, 1963, 178-185 පිටු.